| | | | |
|---|---|---|---|
| දිනය Date – 2026.03.05 පැය 0545 | දුරකථන අංකය Tel.NO – 011-2887973 | මගේ අංකය My NO – D/Media/Out/339/2026 | විද්‍යුත් ලිපිනය E-Mails – dir.media@police.gov.lk |


<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු</u>
<u>Important information reported to the Police Media Division</u>

01. කේරළ ගංජා තොගයක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කයිට්ස් පොලිස් ස්ථානය.

2026.03.04 දින දහවල් කයිට්ස් පොලිස් වසමට අයත් සුරුවිල් වෙරළ තීරයේදී කයිට්ස් පොලිස් ස්ථානයේ නිලධාරින් විසින් නාවික හමුදාවේ නිලධාරින් හා පොලිස් විශේෂ කාර්යංශයේ නිලධාරින් සමඟ ඒකාබද්ධව වැටලීමක් සිදුකර කේරළ ගංජා කිලෝග්‍රෑම් 368 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

සැකකරු අවුරුදු 34 ක් වන වේලනී ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.

මෙම කේරළ ගංජා තොගය ධීවර බෝට්ටුවක් මඟින් ඉන්දියාවේ සිට මෙරටට රැගෙන එන ලද බවට පොලිසිය සැකකරන අතර වැඩිදුර විමර්ශන කයිට්ස් පොලිසිය විසින් සිදු කරනු ලබයි.

Suspect Arrested with a Large Stock of Kerala Cannabis – Kayts Police

Officers of the Kayts Police, together with personnel of the Sri Lanka Navy and the Police Special Bureau, conducted a raid at Suruvil Beach within the Kayts Police Division on the afternoon of 04.03.2026. During the operation, a suspect was arrested in possession of approximately 368 kilograms of Kerala cannabis.

The arrested suspect is a 34-year-old resident of Velanai.

Preliminary investigations indicate that the stock of Kerala cannabis had been smuggled into the country from India by a fishing vessel.

Further investigations are being carried out by the Kayts Police.

02. කුෂ් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශය ගුවන්තොටුපල ඒකකය.

2026.03.04 දින උදෑසන කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපලේ පැමිණීමේ පර්යන්තයේදී ගුවන්තොටුපල රේගු නිලධාරීන් හා පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශය ගුවන්තොටුපල ඒකකයේ නිලධාරීන් විසින් සිදුකල පරීක්ෂාවකදී ඉන්දියාවේ සිට මෙරටට පැමිණි පුද්ගලයෙකු සන්තකයේ තිබී කුෂ් මත්ද්‍රව්‍ය කිලෝග්‍රෑම් 01 ග්‍රෑම් 513 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

සැකකරු අවුරුදු 37 ක් වන ඉන්දිය ජාතිකයෙකි.

පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශය ගුවන්තොටුපල ඒකකය විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

Suspect Arrested with Kush Drug – Police Narcotics Bureau Airport Unit

During a search operation conducted at the arrival terminal of Bandaranaike International Airport, Katunayake, on the morning of 04.03.2026, officers of the Airport Customs together with officers of the Police Narcotics Bureau Airport Unit arrested a suspect in possession of 1 kilogram and 513 grams of the drug known as "Kush."

The suspect was apprehended upon arrival in the country from India.

The arrested individual is a 37-year-old Indian national.

Further investigations are being carried out by the Police Narcotics Bureau Airport Unit.

03. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - වැල්ලම්පිටිය පොලිස් ස්ථානය.

2026.03.04 දින උදෑසන වැල්ලම්පිටිය පොලිස් වසමේ සේදවත්ත කලුපාලම අසලදී වැල්ලම්පිටිය පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් වැටලීමක් සිදුකර අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 100 මිලිග්‍රෑම් 510 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

සැකකරු අවුරුදු 52 ක් වන කොළඹ 13 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.

වැල්ලම්පිටිය පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

Suspect arrested with ice drug - Wellampitiya Police.

On the morning of 2026.03.04, a team of officers from the Wellampitiya Police conducted a raid near Sedawatta Kalupalama in the Wellampitiya Police Division and arrested a suspect with 100 grams and 510 milligrams of ice drug.

The suspect is a 52-year-old resident of Colombo 13.

The Wellampitiya Police are conducting further investigations.

## 04. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කොළඹ අපරාධ කොට්ඨාසය.

2026.03.04 දින රාත්‍රී ග්‍රෑන්ඩ්පාස් පොලිස් වසමේ තොටලඟ කජීමා වත්තට හැරෙන හන්දියේදී කොළඹ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් වැටලීමක් සිදුකර අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 250 මිලිග්‍රෑම් 510 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

සැකකරු අවුරුදු 18 ක් වන කොළඹ 14 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.

කොළඹ අපරාධ කොට්ඨාසය විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## Suspect Arrested with “Ice”– Colombo Crimes Division

On the night of 04.03.2026, officers of the Colombo Crimes Division conducted a raid at the junction leading to Kajima Estate, Thotalanga, within the Grandpass Police Division, and arrested a suspect in possession of 250g and 510mg of the drug known as “Ice.”

The arrested suspect is an 18-year-old resident of Colombo 14.

Further investigations are being carried out by the Colombo Crimes Division.